සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# පළමු වාර පරීක්ෂණය 2018
# පුරවැසි අධ්‍යාපනය

**9 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.
- 1- 5 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

---

01. නීතියේ මූලාශ්‍රයක් ලෙස ........................................................................................................ දැක්විය හැකි ය.

    (ආකල්ප, සිරිත් විරිත්, දේශපාලඥයින්ගේ මත)

02. සමාජ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුව සමග එක්ව කටයුතු කරන ආයතනයක් ලෙස ....................................................................................... දැක්විය හැකි ය.

    (ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ජාතික කාන්තා කමිටුව, පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව)

03. මිනිස් අවශ්‍යතා පහසුකර ගැනීම සඳහා යොදාගනු ලබන ක්‍රමවේදවල ඇතිකරන වෙනස්කම් ...................... ..................................................... ලෙස හැඳින්විය හැකි ය.

    (සමාජයීය වෙනස්කම්, කාර්මික වෙනස්කම්, තාක්ෂණික වෙනස්කම්)

04. ලෝකයේ ජීවත් වන කිසිම පුද්ගලයෙකුට ............................................................................ ජීවත් විය නොහැක.

    (එකට, හුදකලාව, නිදහසේ)

05. රටක සංවර්ධන අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ....................................................................................... අවශ්‍ය වේ.

    (පොදු ප්‍රතිපත්තියකි, ජාතික ප්‍රතිපත්තියකි, දේශපාලන ප්‍රතිපත්ති)

- අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලදීඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. සෑම පුදගලයෙකුටම සැකෙන් තොරව බියෙන් ජීවත් වීමට සමාජයෙන් හිමිවි යුතු ආරක්ෂාව සමාජ සුරක්ෂිතතාවයයි. (.......)

07. සංකීර්ණ ජීවන රටාවකට යොමුවීම නිසා යහජීවන ගුණාංග මිනිසාගෙන් ඈත් වී යයි. (.......)

08. සමූපකාර ව්‍යාපාරය මුලින් ම ආරම්භ වූයේ ණය දෙන සමිති ලෙසිනි. (.......)

09. කාබනික පොහොර නිෂ්පාදනය කරන්නන් කාර්මික අංශයේ රැකියා වෙළඳපලට අයත් වේ. (.......)

10. නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් නොවේ. (.......)

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතර තෝරා යටින් ඉරක් අඳින්න.

11. එකිනෙකාට උදව් කරමින් සහයෝගයෙන් කටයුතු කිරීම.

(1) සාමූහිකත්වය (2) සහජීවනය (3) අන්‍යෝන්‍ය රැඳියාවයි. (4) සහජ හැකියාවයි.

12. තමන් ඇඟලාගත් ඇඳුම තමන් විසින් ම සකසාගත් නායකයෙකි.

(1) ඒබ්‍රහම් ලින්කන් (2) ජවහල්ලාල් නේරු

(3) මහත්මා ගාන්ධි (4) නෙල්සන් මැන්ඩෙලා

13. සමූපාකාරයේ ආදර්ශපාඨය නිවැරදිව අඩංගු පිළිතුර වන්නේ,

(1) සැම එකාටත් එකා සැමටත් (2) එකා සැමටත් සැම එකාටත්

(3) සමගිය බලය වේ. (4) බලය සමගිය වේ.

14. සමාජයේ පවත්නා සියලුම රැකියා අවස්ථා හඳුන්වන්නේ කුමන නාමයෙන් ද?

(1) රැකියා වෙළඳපල (2) වැඩ ලෝකය


(3) රැකියා ලෝකය (4) දේශීය හා විදේශීය රැකියා පෙළඳපල

15. තිරසාර සංවර්ධනය ලෙස අර්ථකතනය කරන්නේ,

(1) ධරණීය සංවර්ධයයි. (2) අධ්‍යාත්මික සංවර්ධයයි.

(3) මානුෂීය සංවර්ධනය (4) සමාජීය සංවර්ධනය


- හිස්තැන් පුරවන්න.


A

16. A රූපයේ දැක්වෙන පුද්ගලයා වන්නේ ..............................................................................

17. ඔහු ඇමරිකාවේ ............................................................ ව්‍යාප්ත කිරීමට විරුද්ධව ඍජුව ක්‍රියා කළේය.

18. ........................................................................................ යන්න ඔහුගේ ප්‍රසිද්ධ කියමනකි.


B

19. B රූපයේ දැක්වෙන පුද්ගලයා වන්නේ .................................................. .

20. මව මියගොස් වසර ගනනාවකට පසුව ඔහු ...................................................................... බවට පත් විය.

## <u>II කොටස</u>

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **මෙම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

01. (i) සමාජ ආරක්ෂිතතාව සඳහා ආගමික ආයතන වලින් ඉටුවන කාර්යයන් 2ක් ලියන්න.

(ii) නීතියේ ගුණාංග 2ක් ලියන්න.

(iii) ආරවුලක් සමත මණ්ඩලය වෙත යොමුකළ හැකි ක්‍රම දෙකක් ලියන්න.

(iv) ජාතික ළමාරක්ෂක අධිකාරිය ඉටුකරන ප්‍රධාන කාර්යයන් දෙකක් ලියන්න.

(v) වත්මන් රැකියා වෙළඳපල ප්‍රධාන අංග දෙකකි.


(vi) වර්තමාන සමාජයට සහජීවනයක අවශ්‍යතාව දැනෙන්නේ ඇයි. කරුණු දෙකක් ලියන්න.

(vii) ජපානයේ පවතින සංස්කෘතිකාංග දෙකක් ලියන්න.

(viii) යම් රටකට හුදකලාව ජීවත්වීම අපහසුවීමට බලපා ඇති හේතු දෙකක් ලියන්න. (ල. 16)

02. (i) දේශීය නීතිය බෙදා දැක්විය හැකි කොටස් තුන ලියන්න. (ල. 03)

(ii)




ඉහත රූපයේ හිස්තැන් පුරවන්න. (ල. 03)

(iii) අන්තර්ජාතික වශයෙන් බලපවත්නා නීති 5ක් ලියන්න. (ල. 05)

03. (i) A රූපයේ සඳහන් නිලධාරියා සම්බන්ධ ආයතනය විසින් සිදුකරන කාර්යයන් 04 ක් ලියන්න. (ල 04)



A

(ii) B රූපයේ සඳහන් ලාංඡනයෙන් දැක්වෙන ආයතනය නම් කොට එම ආයතනයෙන් ඉටුවන කාර්යයන් 3 ක් ලියන්න. (ල. 03)

(iii) ආරක්ෂක හමුදා සම්බන්ධයෙන් පුද්ගලයන්ගෙන් ඉටුවිය යුතු වගකීම් 4 ක් ලියන්න. (ල. 04)



B

04. (i) පහත රූප තුන නම් කරන්න. (ල. 03)


A


B


C

(ii) තාක්‍ෂණයේ වෙනස්වීම් නිසා සමාජයේ ඇති වූ වෙනස්වීම් 4 ක් ලියන්න. (ල. 04)

(iii) තාක්‍ෂණික වෙනස්වීම් නිසා ඇතිවන හිතකර බලපෑම් 2 ක් හා අහිතකර බලපෑම් 2ක් ලියන්න.(ල. 04)

05. (i) 'අලුත් අලුත් දෑ නොතකන ජාතිය ලොව නොනගී'

ඉහත ප්‍රකාශය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද? (ල. 02)

(ii) තාක්ෂණය කෘෂිකර්මයට භාවිතා වන අවස්ථා දැක්වෙන පහත රූප හඳුනාගෙන නම් කරන්න.

'අ'



'ආ'



'ඉ'



(ල. 06)

(iii) තාක්‍ෂණයේ දියුණුවත් සමග වර්තමාන රැකියා වෙළඳපලේ කාර්මික අංශයේ රැකියා ක්ෂේත්‍රයේ ව්‍යාප්ත වූ රැකියා 3 ක් ලියන්න. (ල. 03)

06. (i) සමාජ ප්‍රගමනය සඳහා යහජීවන ක්‍රමයක අවශ්‍යතාව ඇතිවීමට හේතු 2 ක් ලියන්න. (ල. 02)

(ii) මානව සමාජය යහපත්ව පවත්වාගෙන යාම සඳහා ප්‍රගුණ කළ යුතු යහජීවන ගුණාංග 5 ක් ලියන්න. (ල. 05)

(iii) යහජීවන ගුණාංග පුරුදු පුහුණු නොකිරීම නිසා ඇතිවන අයහපත් ප්‍රතිඵල 4 ක් ලියන්න. (ල. 04)

07. (i) මෙම රූපයෙන් දැක්වෙන්නේ කවුරුන් ද? (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමුපකාර සමිති වර්ග 4 ක් ලියන්න. (ල. 04)

(iii) විවිධ සේවා සමූපකාර සමිතියෙන් ඉටුවන සේවාවන් 5 ක් ලියන්න. (ල. 05)



## පිළිතුරු පත්‍රය - I කොටස

(1) සිරිත් විරිත් (2) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (3) තාක්ෂණික වෙනස්කම් (4) හුදකලාව
(5) ජාතික ප්‍රතිපත්තියක් (6) ✗ (7) ✓ (8) ✓ (9) ✗ (10) ✓ (11) 3
(12) 3 (13) 2 (14) 2 (15) 1 (16) ඒබ්‍රහම් ලින්කන් මහතා ය. (17) වහල් භාවය
(18) ඔබ කුමක් කළත් හොඳ කෙනෙකු වන්න. (19) තෝමස් අල්වා එඩිසන්.
(20) ශතවර්ෂයේ ශ්‍රේෂ්ඨ නිර්මාණකරුවෙකු

(2 x 20 = 40)

## II කොටස

01. (1) විනය හා ශික්ෂණය ඇති කිරීම. ගුණගරුක පුරවැසියන් බිහි කිරීම.
යහපත් ආකල්ප ඇති කිරීම. අධ්‍යාත්මික සංවර්ධනයට මග කියාදීම.... ආදී

(2) නීති කඩ කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වීම. නිරවුල්ව හා පැහැදිලිව දැක්විය යුතු වීම.
වෙනස්වන සමාජ අවශ්‍යතා අනුව වෙනස් වීම. මිනිසාගේ බාහිර හැසිරීම හා ක්‍රියාකාරකම් පාලනය කිරීම ...ආදී

(3) පොලිසිය මගින්. අධිකරණය මගින්. පෞද්ගලික යොමු කිරීම් මගින් ..... ආදී

(4) ළමා අපයෝජන සම්බන්ධ නෛතික මැදිහත්වීම්.
විශේෂ පොලිස් විමර්ශන
ළමා හිංසනය හා අපචාර පිළිබඳ දැනුම්වත් කිරීම සඳහා සෘජු දුරකතන අංක (1929) පවත්වාගෙන යාම..... ආදී

(5) දේශීය රැකියා වෙළඳපල. විදේශීය රැකියා වෙළඳපල.

(6) සමාජ යහපැවැත්ම සඳහා. පුද්ගල අභිරුචිවල විවිධත්වය නිසා. ජීවන රටාව සංකීර්ණ වීම නිසා

(7) හිසනමා ආචාර කිරීම. කිමෝනාව ඇඳීම. සුමෝ ක්‍රීඩාව. මළවුන් ඇදහීම

(8) සම්පත් විසංතුලනය. ගෝලීය විවිධත්වය. තාක්ෂණික දියුණුව.
තම රටට අවශ්‍ය දේ තම රටට නිපදවාගත නොහැකි වීම. (2 x 8 = 16)

02. (i) ආණ්ඩුක්‍රමව්‍යවස්ථා නීතිය, අපරාධ නීතිය, සිවිල් නීතිය (ල. 03)

(ii) A - අභියාචනාධිකරණය
B - පළාත්බද මහාධිකරණය
C - දිසා අධිකරණය (ල. 03)

(iii) අන්තර්ජාතික මානව හිමිකම් නීතිය/ අන්තර්ජාතික සාගර නීතිය/ අන්තර්ජාතික පරිසර නීතිය/
අන්තර්ජාතික සංක්‍රමණ නීතිය/ අන්තර්ජාතික ආයෝජන නීතිය ...... ආදී (ල. 05)

03. (i) රථවාහන හැසිරවීම/ පාර මාරු වීමට උදව් වීම / ප්‍රජා ආරක්ෂාව සැපයීම/ විවිධ උත්සව රැස්වීම් සඳහා ආරක්ෂාව සැපයීම ... ආදී (ල. 04)

(ii) අභ්‍යන්තරව හා බාහිරව රටට එල්ලවන යුද්ධමය තර්ජන වලින් මාතෘභූමිය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.
රහසිගතව මුහුදු මාර්ගයෙන් සිදුවන මත්ද්‍රව්‍ය වෙළඳාම පිළිබඳ සොයා බැලීම.
අනවසර සංක්‍රමණ වැලැක්වීම./ අනවසර ධීවර කටයුතු වැලැක්වීම./ ආපදාවලදී පිහිට වීම. (ල. 03)

(iii) කැරලි මර්ධන කටයුතුවලට බාධා නොකිරීම./ මියගිය හා ආබාධිත රණවිරුවන් පිළිබඳව සංවේදීව කටයුතු කිරීම
රණවිරු සුභසාධන කටයුතුවලට හැකි අයුරින් දායක වීම.
සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාමට සහාය වීම..... ආදී (ල. 04)

04. (i) A කුඩාරමක් B කටුමැටි ගෙයක් C නවීන තට්ටු නිවසක් (ල. 03)

(ii) මිනිසාගේ පාරිභෝජන රටාව වෙනස් වීම. නව රැකියා රැසක් බිහිවීම

නව විලාසිතා බිහිවීම නවීන වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ඇතිවීම

මිනිසාගේ සිතුම් පැතුම් වෙනස්වීම..... ආදී (ල. 04)

(iii) හිතකර බලපෑම් - වැඩ පහසු වීම. කාලය ඉතිරි වීම. සම්පත් නාස්තිය අඩු වීම....... ආදී

අහිතකර බලපෑම් - පරිසර දූෂණය වේගවත් වීම., අනවශ්‍ය පරිභෝජන රටාවකට යොමුවීම.

මිනිසුන් යාන්ත්‍රීකරණය වීම., විවිධ ලෙඩ රෝගවලට ගොදුරු වීම.... ආදී (ල. 04)

05. (i) කුමාරතුංග මුනිදාස (ල. 02)

(ii) රසායනික පොහොර යෙදීම./ පලිබෝධනාශක යෙදීම/ විසිරි ජල සම්පාදනය. (ල. 06)

(iii) විද්‍යුත් තාක්‍ෂණික ශිල්පීන්/ මෘදුකාංග ශිල්පීන්/ පරිගණක තාක්‍ෂණ ශිල්පීන්/ රොබෝ තාක්‍ෂණ ශිල්පීන්....... ආදී

(ල. 03)

06. (i) සමාජ යහපැවැත්ම සඳහා පුද්ගල අභිරුචිවල විවිධත්වය නිසා, ජීවන රටාව සංකීර්ණ වීම නිසා ආදී (ල. 02)

(ii) නීතිගරුක බව, අවංක බව, කරුණාව, ඉවසීම, ධාර්මික බව, සුහදශීලී බව (ල. 04)

(iii) •සමාජ විරෝධි ක්‍රියා වැඩි වීම. •අපරාධ වැඩිවීම •යහපැවැත්ම බිඳ වැටීම

•සමාජ ආරක්ෂිත බව බිඳ වැටීම •ආතතිය වැඩි වීම •අන්තර් පුද්ගල සබඳතා බිඳ වැටීම ..... ආදී (ල. 05)

07. (i) •රොබට් ඕවන් මහතා •විවිධ සේවා සමූපකාර සමිති •ධීවර සමූපකාර සමිති (ල. 02)

(ii) •සමූපකාර ණය දෙන සමිති •රෝහල් සමූපකාර සමිති...... ආදී (ල. 04)

(iii) •අධ්‍යායන සේවා •රක්‍ෂණ සේවා •ළදරු පාසල්

•උකස් කටයුතු •ස්වයංසේවා අලෙවිසැල් •බැංකු සේවා...... ආදී (ල. 05)